# මුහුණට මුහුණ

ශ්‍රීනාත් මද්දුමගේ

## බොනී ප්‍රනාන්දු ගේ මෙහෙයවීමෙන් මධුර අතීතේ සංගීත ප්‍රසංගය

ජූනි 14 වන දා සිඩ්නි නුවරදී

ශ්‍රීනාත්
මොකක්ද මේ සංගීත ප්‍රසංගයේ අරමුණ

බොනී
මේ ප්‍රසංගයේ අරමුණ තමයි ජෝතිපාල මහතා ඇතුලු අපෙන් වියෝ වූ ප්‍රවීණ ගායක ගායිකාවන්ගේ අපේ සදා මතකයේ තිබෙන ගීත සිඩ්නි නුවර ඉන්න අපේම ප්‍රවීණ ගායක ගායිකාවන්ගේ මියුරු හඬින් ඉදිරිපත් කිරීමත් පැරණි ශිල්පීන්ට උපහාරයක් දැක්වීමත්.

එච් ආර් ජෝතිපාල මොහිදීන් බෙග් රුක්මනී දේවි ක්ලැරන්ස් විජේවර්ධන එම් එස් ප්‍රනාන්දු මිල්ටන් මල්ලවාරච්චි වැනි අපේ හදවත් තුළ රැඳී සිටින අපෙන් වියෝ වුණ මේ ශිල්පීන්ට උපහාරයක් දැක්වීමත් තමයි මෙහි ප්‍රධාන අරමුණ. ඒ වගේම මම පෞද්ගලිකව දන්නවා වයස් සීමාවකින් තොරව හැම කෙනෙක්ම මේ ශිල්පීන්ගේ ගීත වලට ආදරය දක්වන බව.

ශ්‍රීනාත්
ඔබ සංගීත් ක්ෂෙත්‍රයට පිවිසුනේ කොහොමද?

බොනී
පාසල් යන කාලයේ ඉඳන්මයි. මම කුරුණෑගල ශාන්ත ආනා විදුහලේ හා කොටහේන ශාන්ත බෙනඩික්ට් විදුහලේ මම ඉගෙනුම ලැබුවා. මෙහිදී මම මුලින්ම සංගීතයට යොමු වුණා. මම මුල්ම ගැයුවේ ඉංග්‍රීසි ගීතයි. මම ගුවන් විදුලයේ සජීවී වැඩ සටහන් අතරින් Elasto Moving Design/Star of lanka වැඩ සටහන් වල ගීත ගායනා කළා. ඒ වගේම ලිට්ල් හට් සහ කැන්ඩි ලේක් ක්ලබ් වැනි සමාජ ශාලා වලද ගීත ගායනා කළා. අපි පස් දෙනෙක් එකතු වෙලා ෆ්‍රීඩම් කියා සංගීත කණ්ඩායමක් ආරම්භ කලා. මේ ෆ්‍රීඩම් කියන නම අපේ සංගීත කණ්ඩායමට දැම්මේ ක්ලැරන්ස් විජේවර්ධන මහතායි. අපේ සංගීත කණ්ඩායම ජනප්‍රිය වුණා.

ශ්‍රීනාත්
ඔබ මුලින්ම තැටියකට ගීත ගායනා කළේ මොන වසරේද?

බොනී
1977 පෙම්ටෝන් ලේබලය යටතේ ගීත 4 ක් පටිගත කළා. මෙම තැටියට උපේන්ද්‍ර ප්‍රනාන්දුත් ස්ටැන්ලි පීරිසුත් සංගීතය මුසු කලා. ප්‍රේමකීර්ති ද අල්විස් මෙහි ගීත රචනා කළා.

ශ්‍රීනාත්
ඔබ එතැනින් පටන් අරන් 1997 වන තුරු නිහඬව සිටියේ ඇයි?

බොනී
ඒකට හේතුව තමයි මම 1978 දී ජර්මනියට යාම. නමුත් ජර්මනියේ දීත් මම ගීත ගයනා කළා. ෆ්‍රැන්ක්ෆර්ට් සොනිත්සයින් වැනි සුප්‍රසිද්ධ සමාජ ශාලා වල මං ගීත ගායනා කළා. 1986 දී මම ඔස්ට්‍රේලියාවට ආවා. එහිදී මම විවිධ ප්‍රසංග වලට සහභාගි වුණා. ඒ එක්කම 2003 ඔස්ට්‍රේලියන් මියුසික් අවෝඩ් තරගයේ වර්ල්ඩ් මියුසික් කාන්ඩයට මගේම සිංහල සින්දුවක් මං ඉදිරිපත් කළා. 'රෑ යාමේ සිහින රේඛා' තමයි ඒ සින්දුව. සරත් දසනායක අයියා තමයි ඒක සංගීතවත් කළේ. ලිව්වේ චන්ද්‍රදාස ප්‍රනාන්දු. ගීත දහස් ගණනකින් ඒ ගීතය ටොප් 20 වර්ල්ඩ් එකට ආවා.

ශ්‍රීනාත්
ඔබේ අලුත්ම සංගත තැටිය ගැන කතා කරමුද?





බොනී
ඒකෙ නම තමයි 'රෑ රැජිනක්'
මෙය තරංගා ලේබලය යටතේ නිෂ්පාදනය වුණා. මෙහි විශේෂයක් වුණේ ජෝතිපාල මහත්මයාගේ ගීත කීපයකුත් ඒ වගේම ඉන්දියානු භාග්‍රා සංගිතයට අනුව නිර්මානය වුණ ගීත කීපයකුත් ඇතුළත් වීම. මෙහි ගීත කීපයක් රෝහණ වීරසිංහ මහතා අතින් නිර්මාණය වුණා. යුග ගායනයෙන් නෙලූ අධිකාරි උරේෂා රවිහාරි සම්බන්ධ වුණා. මේ සංගත තැටියේ රණවිරුවන් වෙනුවෙන් විශේෂ ගීතයක් මම ගායනා කළා.

ශ්‍රීනාත්
ඔබේ පුවලේ අය සංගීතයට සම්බන්ධ නැද්ද?

බොනී
මගේ බිරිඳ දේවිකා හා පුතා හා දියණිය ලොකු සහයෝගයක් මට දෙනවා. ඒ එක්කම දුව ඩියාන් ද කලා කටයුතු වලට සම්බන්ධයි. ඇය ශ්‍රියානි අමරසේන අධ්‍යක්ෂණය කළ පෙරළිය ටෙලි නාට්‍යයේ රඟ පෑවා. පුතාට හොඳට ගිටාරය වයන්න පුලුවන්.

ශ්‍රීනාත්
ඔබ සංගීත කණ්ඩායමක් පිහුටුවාගෙන තිබෙනවා නේද?

බොනී
ඔව්. බොනී ඇන් ද ගැන්ග් නමින් සංගීත කණ්ඩායමක් පිහුටුවා තිබෙනවා. අපේ සංගීත කණ්ඩායම විවිධ සන්දර්ශන වලට සහභාගි වෙනවා. අපට ලැබෙන ප්‍රතිචාර හුඟක් හොඳයි.

ශ්‍රීනාත්
ඔබේ අනාගත බලාපොරොත්තු මොනවාද?

බොනී
ලංකාවේ අපේ ශිලිපීන් සමග සංගීත වැඩ සටහන් කීපයක් සහ අලුත් ගීත කීපයක් පටිගත කරන්න බලාපොරොත්තු වෙනවා

ශ්‍රීනාත්
ඔබේ මේ ගමනට උදව් කළ අය කව්ද?

බොනී
හුඟ දෙනෙක් ඉන්නවා. නම් වශයෙන් කියන්න යන්නෙ නැහැ. නමුත් මගේ බිරිඳ ඇතුලු දරුවන් දෙදෙනාත් සිඩ්නි නුවර වෙසෙන ශ්‍රීලාංකිකයන් සියල්ලන්ටමත් මම ස්තුතිවන්ත වෙනවා.
මගේ ඉදිරි ගමනට ඔවුන්ගෙන් ලැබෙන්නේ මහත් පිටුවහලක්.

ශ්‍රීනාත්
අවසන් වශයෙන් සන්නස පාඨකයන්ට ඔබ කියන්න කැමති මොකක්ද?

***මේ ප්‍රසංගයේ අරමුණ තමයි ජෝතිපාල මහතා ඇතුලු අපෙන් වියෝ වූ ප්‍රවීණ ගායක ගායිකාවන්ගේ අපේ සදා මතකයේ තිබෙන ගීත සිඩ්නි නුවර ඉන්න අපේම ප්‍රවීණ ගායක ගායිකාවන්ගේ මියුරු හඬින් ඉදිරිපත් කිරීමත් පැරණි ශිල්පීන්ට උපහාරයක් දැක්වීමත්.***

බොනී
ස්කැට්ස් සංවිධානයේ පූර්ණ අනග්‍රහණයෙන් ජූනි 14 වැනිදා සවස 7 ට පෙනන්ට්හිල්ස් ප්‍රජා ශාලාවේ දී 'මධුර අතීතේ' ප්‍රසගය පැවැත්වෙනවා. ඒ ප්‍රසංගය නැරඹීමට පැමිණෙන මෙන් සැමදෙනාගෙන් මේ වෙලාවේ ඉල්ලා සිටින්න මම කැමතියි. මෙය ඔබට අමතක නොවන රාත්‍රියක් වෙනවා නිසැකයි











## ශ්‍රී ලංකා මෝනිං ෂෝ සම්මාන දිනයි



ඔස්ට්‍රේලියාවේ ප්‍රජා රූපවාහිනී සේවා සඳහා වාර්ෂිකව පිරිනැමෙන ඇන්ටෙනා සම්මාන උළෙලේ දී නිමල් අල්විස් මහතා ගේ මෙහෙයවීමෙන් ගුවනට මුසුවන ශ්‍රී ලංකා මෝනිං ෂෝ රූපවාහිනී වැඩ සටහන සම්මාන දිනා ගත්තේ ය. නිමල් එම සම්මානය ලබා ගත් මොහොත ඡායාරූපයේ දැක්වෙයි